මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික මහාචාර්ය රත්නජීවන් හූල් වෙත ජනමාධ්‍ය ඔස්සේ දිගින් දිගටම ඒක පාර්ශවික විවේචනයන් එල්ල කිරීම මේ දිනවල දක්නට ලැබේ. ගැටළුව වන්නේ ඇතැම් මාධ්‍යයන් මගින් ඒක-පාර්ශවිකව මතයන් හා තොරතුරු දැක්වීමෙන් නොනැවතී, නිරවද්‍යතාවයද ප්‍රශ්නකාරී වන ආකාරයේ පුවත් වාර්තා සහ කතුවැකි ඉදිරිපත් කිරීමයි. මැයි 24 දින "රත්නජීවන් හූල්" යන මැයෙන් පළවූ දිවයින පුවත්පතේ කතුවැකිය මීට නිදසුනකි.

මෙහිදී දිවයින කතුවැකියෙන් සිදුකරන්නේ රත්නජීවන් හූල් වෙත ප්‍රහාර එල්ල කිරීම පමණක් නොවේ. මාධ්‍ය මගින් වාර්තා කරනා සිදුවීම් සිදු නොවූ බව දන්වමින් මැයි 20 වෙනි දින මැ,.කො.ස. මහින්ද දේශප්‍රිය විසින් දිනපතා දිවයින ප්‍රධාන කර්තෘ වෙත නිල වශයෙන් යවා ඇති ලිපිය පවා එහිදී නොසලකා හැර ඇති බවක් පෙනී යයි. මෙසේ මැයි 20 වෙනි දින දේශප්‍රිය විසින් යැවූ ලිපියේ ප්‍රතික්ෂේප කර ඇති කරුණු යළි යළිත් සත්‍ය ලෙසින් දක්වමින් මැයි 24 කතුවැකිය තුළ පළ කරන්නට දිවයින කටයුතු කරයි. මෙය නිරවද්‍යතාවය බරපතළ ලෙසින් කඩ කිරීමක් මෙන්ම, පාඨකයාව නොමඟ යැවීමටද කටයුතු කිරීමකි.

මැ.කො.ස විසින් යැවූ ලිපියට අමතරව, රත්නජීවන් හූල් විසින් තමන්ට මාධ්‍ය ඔස්සේ නැගෙන චෝදනාවන්ට කරුණු පැහැදිලි කරමින් මැයි 21 දින කලම්බු ටෙලිග්‍රාෆ් ඔස්සේ දක්වා තිබූ ප්‍රකාශය සම්බන්ධයෙන් පවා කිසිදු සඳහනක් දිවයින කතුවැකියේ දක්නට නොවේ.

මෙසේ සාවද්‍ය යැයි සිදුවීමේ පාර්ශවයන් දෙකම විසින් නිල වශයෙන් දක්වා ඇති කරුණු නැවත නැවතත් ජනගත කරන්නට උත්සාහ ගැනීමෙන් දිවයින සිදුකරන්නේ බරපතළ මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයකි. අතිශයින්ම වගකීම් විරහිත මාධ්‍යකරණයකි.

මහාචාර්ය රත්නජීවන් හූල්ගේ ප්‍රකාශය ඇතුළත් කලම්බු ටෙලිග්‍රාෆ් ලිපිය (දිවයින කර්තෘ වෙත මැ.කො.ස. යැවූ ලිපිය සම්බන්ධයෙන් තොරතුරුද මෙම ලිපිය තුළ ඇතුළත් වේ)
: https://www.colombotelegraph.com/index.php/elilini-hoole-defamation-by-several-news-outlets/

**#MediaEthics #lka #SinhalaPress #SundayDivaina**